**පාසල් අධ්‍යාපන ක්‍රමය දැනුමේ කේන්ද්‍රීය පදනම ලෙස පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය (ටීඑස්ඊපී) - පළාත් මට්ටම - 2015**

---

පාසල් අධ්‍යාපන ක්‍රමය දැනුමේ කේන්ද්‍රීය පදනම ලෙස පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2012 මැයි 18 දින එළඹි අංක 5037 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 2 හි II (ආ) (3) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඕස්ට්‍රේලියානු භාර අරමුදල අතර 2013 ජුලි 18 දින එළඹි අංක ටීඑෆ් 013267 දරන ඕස්ට්‍රේලියානු ප්‍රදාන ගිවිසුමේ II (ආ) (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වලට අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියේ ජාතික මට්ටමේ කාර්යයන් සිදුකිරීමට අපේක්ෂා කරන අතර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ සියළුම පළාත් සභා වල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පළාත් මට්ටමේ කාර්යයන් සිදුකිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ල ප්‍රකාරව, රටේ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝග සඳහා යොමුවීමට 2012-2016 අධ්‍යාපන ක්ෂේත්‍ර සංවර්ධන කාර්යය රාමුවක් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහයෝගය ලබාදීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, ශ්‍රී ලංකාවේ දැනුම පදනම් වූ ආර්ථිකය සහ සමාජ සංවර්ධනය උදෙසා අත්තිවාරමක් සැපයීම සඳහා ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන ප්‍රවේශය හා ගුණාත්මක බව වැඩි කිරීමයි. මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වලට අනුව, රු.මිලියන 11,000 කට සමාන විශේෂ ගිම්හාර අයිතිවාසිකම් (SDR) මිලියන 64.1 ක (එජඩො මිලියන 100) ණය මුදලක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබූ අතර ඕස්ට්‍රේලියානු භාර අරමුදල විසින් එජඩො මිලියන 11 ක ප්‍රදාන සැපයීමට එකඟ වී තිබුණි. එයින් සියයට 70 ක් පළාත් අධ්‍යාපන අධිකාරීන් සඳහා වෙන්කර තිබුණු අතර ඉතිරි සියයට 30 අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා වෙන්කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2012 ඔක්තෝබර් 01 දින ආරම්භ කරන ලද අතර 2017 ජුනි 30 වන විට නිම කිරීමට නියමිතය. ප්‍රදාන යටතේ සිදුකළ යුතු කාර්යයන් 2016 අප්‍රේල් 30 වන විට නිම කිරීමට නියමිතය. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පළාත් මට්ටමින් සිදුකළ කාර්යයන් පිළිබඳ මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.3 ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

පළාත් සභා වල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයන්හී විසර්ජන ගිණුම් එකතු කිරීමෙන් මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම

පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද ප්‍රගති වාර්තා සහ වැඩි දියුණු කරන ලද මූල්‍ය වාර්තා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වියදම් සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සහ ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනයන්ගෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය හා ප්‍රදාන වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය හා ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය හා ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය හා ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(උ) මුදල් රෙගුලාසි 150 සහ පළාත් සභා ප්‍රධාන ලේකම්වරු විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේ ද යන බව.

(ඌ) විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේ ද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේ ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

--------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ ,

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද පළාත් සහා අධ්‍යාපන අමාත්‍යාංශවල 2015 වර්ෂයේ විසර්ජන ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ පළාත් සභා ප්‍රධාන ලේකම්වරු විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් වල සඳහන් විධිවිධානවලට අනුකූල වන පරිදි පිළියෙල කර ඉදිරිපත් කර ඇත. ඉහත විසර්ජන ගිණුම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශ විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත්, ලේඛන හා වාර්තා සමඟ එකඟ වේ. 2015 වර්ෂය සඳහා ණය සහ ප්‍රදාන මුදල් වලින් දරන ලද පිරිවැය පළාත් සභා අධ්‍යාපන අමාත්‍යාංශ විසර්ජන ගිණුම්වල සහ මෙහෙයුම් හා නියාමන සහාය ඒකකයේ නියමිත පරිදි වාර්තා කර තිබුණු බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඇ) විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය හා ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

--------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

--------------------------

ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව අනුව සියලුම පළාත් සභා වල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ හා මෙහෙයුම් හා නියාමන සහාය ඒකකය විසින් සියලු මූලාශ්‍රවලින් ලද අරමුදල් වලින් දරන ලද මුළු ව්‍යාපෘති පිරිවැය රු.මිලියන 122,872.66 ක් විය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ අයවැය ඇස්තමේන්තු වලට සහාය වීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් හා ඕස්ට්‍රේලියානු භාර අරමුදලෙන් ලැබුණු අරමුදල් මූල්‍යායනය, සමාලෝචිත වර්ෂයේ අයවැයගත වෙන්කිරීම් සහ සමාලෝචිත වර්ෂය තුල හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | මූලා ගිවිසුමට අනුව මූලායනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුල | | 2015 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ජාසංස (JDA) | 59 | 7,670 | 2,430 | 14.60 | 2,004 | 48.60 | 6,329 |
| ඕභාඅ (CAUSAID) | 11 | 1,430 | 550 | 5.00 | 750 | 18.00 | 2,407 |
| එකතුව | 70 | 9,100 | 2,980 | 19.60 | 2,754 | 66.60 | 8,736 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, 2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මගින් පළාත් සභා වල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ වෙත කරන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.මිලියන 124,917 ක් අතුරින්, වර්ෂය අවසානයට රු.මිලියන 1,856 ක ප්‍රතිපාදන වියදම් නොකර ඉතිරිවී තිබුණි. දකුණ, බස්නාහිර සහ සබරගමුව පළාත් වල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ වෙත කරන ලද ප්‍රතිපාදන අතුරින් සියයට 20 ට වැඩි ප්‍රතිපාදන වියදම් නොකර ඉතිරිවී තිබු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ආ) ලැබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් මධ්‍යම පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත කරන ලද මුළු වෙන් කිරීම වූ රු.මිලියන 492 ක් අතුරින්, රු.මිලියන 145 ක වෙන් කිරීම් වර්ෂය අවසානයට වියදම් නොකර ඉතිරිවී තිබුණි. තවද, ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂයේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කරන ලද රු.මිලියන 183 ක් අතුරින්, එකතුව රු.මිලියන 29 ක් උතුරු පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ තැන්පත් ගිණුමේ ඉතිරිවී තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

මූලා ගිවිසුමේ උපලේඛන 01 අනුව ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපනයට ප්‍රවේශවීම ප්‍රවර්ධනය, අධ්‍යාපන ගුණාත්මක බව ඉහල නැංවීම හා පාලනය හා අධ්‍යාපන සේවා සැපයීම සවිබල ගැන්වීම යන ප්‍රධාන අරමුණු 03 යටතේ මුදල් වියපැහැදම් කිරීම් සම්බන්ධ දර්ශක සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු විය. ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාළ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, පළාත් පාසල් 135 ක මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනට එම විද්‍යාගාර ගොඩනැගිලිවල සියලුම ඉදිකිරීම් කටයුතු සැලකිය යුතු මට්ටමකට නිමකර තිබුණි. සබරගමුව පළාතේ උඩගම මහා විද්‍යාලයේ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරය 2015 අප්‍රේල් 06 වන විට සිසුන්ගේ භාවිතය සඳහා විවෘත කර තිබුණද, විදුලිබල සැපයුම නොමැති වීම හේතුවෙන් 2015 අප්‍රේල් 06 සිට 2015 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 6.25 ක් වටිනා පරිගණක 61 ක් හා අනිකුත් උපාංග ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) 2014 වර්ෂය තුල ව්‍යාපෘතිය රු.මිලියන 14.33 ක පිරිවැයකට පරිගණක සහ උපාංග 151 ක් ප්‍රසම්පාදනය කර සබරගමුව පළාතේ පළාත් පාසල් වෙත බෙදාහැර තිබුණි. පරිගණක 10 ක් සම්බන්ධයෙන් සිදුකල නියදි පරික්ෂණය අනුව, මෙහෙයුම් පද්ධතියේ දුර්වලතා හේතුවෙන්, පරිගණක 02 ක් අක්‍රිය තත්ත්වයෙන් පවතින බව අනාවරණය විය. තවද, කිසිදු පරිගණකයකට බාහිර ශබ්ද විකාශන උපකරණ සපයා නොතිබුණි. සියලු උපකරණ පිරිවිතරයන්ට අනුකූල වන බවට සහ පරික්ෂා කළ බවට තාක්ෂණික ඇගයීම් කමිටුව තහවුරු කර තිබුණද, පරිගණක සඳහා වූ නිෂ්පාදකයින්ගේ බලපත්‍ර විගණන කාර්යයන් සඳහා ඉදිරිපත් නොකෙරිණි.

(ඇ) මධ්‍යම පළාතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා උපකරණ ප්‍රසම්පාදනය කිරීමට වෙන් කරන ලද මුළු මුදල වූ රු.මිලියන 129.38 අතුරින්, රු.මිලියන 96.38 ක වෙන් කිරීම් අදාල කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබූ බව නියදි විගණන පරික්ෂණයේදී අනාවරණය විය. තවද, වර්ෂය තුලදී රු.මිලියන 5.04 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කළ උපකරණ 2015 දෙසැම්බර් 30 දින වන විටද මධ්‍යම පළාතේ පළාත් පාසල් වෙත බෙදාහැර නොතිබුණි. 2015 සැප්තැම්බර් 30 සිට 2015 ඔක්තෝබර් 04 දක්වා කොළඹ දී පැවැත්වුණු සමස්ත ලංකා ක්‍රීඩා උත්සවය සඳහා සහභාගී වූ පාසල් සඳහා ක්‍රීඩා ඇඳුම් කට්ටල 3,000 ප්‍රසම්පාදනය කිරීමට මධ්‍යම පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාකර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, මධ්‍යම පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙම ක්‍රීඩා ඇඳුම් 2015 දෙසැම්බර් 09 සහ 2016 ජනවාරි 01 දින සපයා තිබුණි. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ පැහැදිලි කිරීම් අනුව, තෝරාගත් සැපයුම්කරු විසින් දෝෂ සහිත භාණ්ඩ සපයා තිබූ අතර තෝරාගත් පාසල් වෙත බෙදා හැර නොතිබුණි.

(ඈ) පළාත් මට්ටමින් සිදුකරන ලද විස්තරාත්මක විගණනයන් අනුව, පාසල් පාදක ඇගයීම් වාර්තා භාරදීමේ ප්‍රමාදයන්, ගුණාත්මක යෙදවුම් කාර්යයන් සඳහා කරන ලද වෙන් කිරීම් උපයෝජනය කිරීමේ ක්‍රියාමාර්ගයන්හී දුර්වල බව සහ අධ්‍යාපන කාර්යයන් සඳහා ලී බඩු හා උපකරණ වැනි සම්පත් වල හිඟකම වැනි දුර්වලතා වයඹ පළාතේ පාසල් වල සිදුකරන ලද විගණනයේ දී නිරීක්ෂණය විය. තවද, සබරගමුව හා ඌව පළාත් වල ශිෂ්‍යත්වලාභීන් සඳහා වූ ප්‍රේෂණ ආපසු යැවීමේ අවස්ථා නිරීක්ෂණය වූ අතර අදාල පළාත් වල කලාප අධ්‍යාපන කාර්යාල වල පොදු තැන්පත් ගිණුම් වල එවැනි මුදල් රඳවාගෙන තිබුණි.

(ඉ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ විසින් නඩත්තු කරන ලද වාර්තා අනුව, උතුර, වයඹ, උතුරුමැද, ඌව, බස්නාහිර හා සබරගමුව පළාත් වල දුෂ්කර ප්‍රදේශ වල පාසල් වල ප්‍රධාන විෂයයන් සඳහා සැලකිය යුතු පාසල් ගුරු පුරප්පාඩු පැවති අතර එම පළාත් වල නාගරික ප්‍රදේශ වල පාසල් වල ගුරු අතිරික්තයක් විය. තවද, සබරගමුව, ඌව, වයඹ හා උතුරුමැද පළාත් වල පාසල් විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් මාරු කිරීමේ ක්‍රමවේදය විධිමත් ලෙස ක්‍රියාත්මක කර නොතිබූ අතර ඒ හේතුවෙන්, පාසල් විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් වසර 10 කට වඩා එකම පාසලේ රැඳී සිටියහ. ඊට අමතරව, සබරගමුව සහ වයඹ පළාත් පාසල් වල ගුරුවරුන් ඌන උපයෝජිතව සිටින බව විස්තරාත්මක විගණනයේ දී නිරීක්ෂණය විය.

**3.3 නිශ්ඵල ගනුදෙනු**

**-------------------**

2015 නොවැම්බර් 16 සිට නොවැම්බර් 29 දක්වා පිළිවෙලින් පිලිපීනයේ සහ තායිලන්තයේ පැවැත්වූ පාසල් පාදක කළමනාකරණය සහ ගුරු සංවර්ධන කාර්යයන් සම්බන්ධ පුහුණු වැඩමුළුව සඳහා සහභාගී වූ නිලධාරීන් 23 දෙදෙනකු සඳහා ගුවන් ටිකට් පත්, අනියම් වියදම් ආදිය සඳහා රු.මිලියන 24.23 ක මුදලක් මධ්‍යම පළාතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වියදම් කර තිබුණි. පාසල් පාදක කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීමට ඍජු සම්බන්ධයක් නොමැති නිලධාරීන් 04 දෙනෙකු ද පුහුණු වැඩමුළුව සඳහා සහභාගී වී තිබූ අතර ඔවුන් සඳහා ගමන් වියදම් හා අනිකුත් පිරිවැය ලෙස එකතුව රු.මිලියන 4.20 ක් ව්‍යාපෘතිය විසින් වියදම් කර තිබූ බව නිරීක්ෂණය විය.

**3.4 අදාළ නොවූ වියදම්**

**----------------------**

පුහුණු හා ධාරිතා සංවර්ධනය හා රාජ්‍ය පාසල් සංවර්ධන කාර්යයන් සඳහා කරන ලද වෙන් කිරීම් වලින්, සබරගමුව පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 30 දින රු.මිලියන 2 ක පිරිවැයකට ටැබ්ලට් පරිගණක 18 ක් ප්‍රසම්පාදනය කර තිබූ බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා ඍජු සම්බන්ධයක් නොමැති සබරගමුව පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවන වෙනත් ආයතන වල රැකියාවේ නියුතු නිලධාරීන් සඳහා පරිගණක 08 ක් වෙන් කර තිබූ බව නිරීක්ෂණය විය.